2011.10.03 දින පැවති සාකච්ජාවෙන් පසු කෙටුම්පත් කල පරිපාටිය

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය**

01. මෙම ස්ථාන මාරු පරිපාටිය ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරින් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් අතර ස්ථාන මාරු කිරීම සඳහා අදාල වන වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය වේ. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව ඇතුළත සේවා ස්ථානවලට ස්ථාන මාරු කිරීම මෙම පරිපාටියෙන් ආවරණය නොවේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන මෙම ස්ථාන මාරු පරිපාටියට අනුකූලව සේවයේ පරිපාලන බලධාරියා වන ලේකම් විසින් පත්කරනු ලබන ස්ථාන මාරු මණ්ඩලයක් විසින් වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම්පත් සහ අදාල අනෙකුත් විස්තර සලකා බලා ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත ලේකම් විසින් ස්ථාන මාරු නියෝග කරනු ලැබේ.

03. වාර්ෂික ස්ථාන මාරු වලින් පරිබාහිරව අනුමත කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව නොඉක්මවන පරිදි පහත දැක්වෙන හේතුමත ස්ථාන මාරුවීමක් කළ යුතු යැයි ලේකම් අදහස් කරන විට ඒ සඳහා ඔහුට බලය පැවරේ. එවැනි ස්ථාන මාරු වීමකින් අතෘප්ති වන නිලධාරින්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමට හැකි වේ.

- (අ) සේවා අවශ්‍යතාවය මත
- (ආ) අන්‍යෝන්‍ය ස්ථාන මාරු මත
- (ඇ) පත් කළ රජයේ වෛද්‍ය මණ්ඩලයක නිර්දේශ මත
- (ඈ) සේවා ස්ථානයේ වෙනසක් නොවන මාරු කිරීම්
- (ඉ) විනය හේතු

04.වාර්ෂික ස්ථාන මාරුවීම්

4.1 ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධාරින්ගේ ඉල්ලීම් ඉටුකිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල ක්‍රියාත්මක කෙරේ.

4.2 එක් අමාත්‍යාංශයක/දෙපාර්තමේන්තුවක/පළාත් සභාවක 8:1 ඡේදය යටතේ නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට තමන් කැමති සේවයේ තනතුරු අනුමතව ඇති වෙනත් අමාත්‍යාංශයකට හෝ දෙපාර්තමේන්තුවකට/පළාත් සභාවකට ස්ථාන මාරුවක් ලබාගැනීමට ඉල්ලුම් කළ හැකිය.

4.3 එවැනි ඉල්ලුම්පත්‍ර ආකෘති පත්‍ර I පරිදි සිය අංශ ප්‍රධානීන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟන් ඉදිරිපත් කළ යුතු වේ. පළාත් රාජ්‍ය සේවයට අනුයුක්ත නිලධාරින්ගේ ඉල්ලුම්පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ සමඟ ඉදිරිපත් කළ යුතු වේ. නිලධාරියා කැමති නම් එම අයදුම්පතේ ප්‍රගමන පිටපතක් ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන නිලධාරියා වෙත ඉදිරිපත් කළ හැකි වේ.

4.4 <u>ස්ථාන මාරුවීම් වලදී සලකා බැලිය යුතු පොදු ප්‍රතිපත්ති පහත පරිදි වේ.</u>

4.4.1 වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී කාලය ගණනය කරනු ලබනුයේ පවත්නා වසරේ ජූනි 30 දිනටය.

4.4.2 සේවා කාලය ගණනය කිරිමේදී අමාත්‍යාංශයේ, දෙපාර්තමේන්තුවේ හෝ පළාත් සභාවේ(දිස්ත්‍රික්කයක්/ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක් තුළ) අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

4.4.3 නියෝජ්‍ය අධ්‍යක්ෂ මට්ටමට පහළ තනතුරු දරණ නිලධාරින් මෙම ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

4.4.4 යම් නිලධාරියෙකු රජයේ අමාත්‍යාංශයක/දෙපාර්තමේන්තුවක වසර 05 ක කාලයක් ද පළාත් සභාවක නම් එම පළාත් සභාව තුල වසර 10 ක කාලයක්ද සේවයේ නිරතව සිටි නම්, අති දුෂ්කර, දුෂ්කර හා ප්‍රියමනාප නොවන සේවා ස්ථානයන්හි සේවා කාලය සම්පූර්ණ කළ නිලධාරින්ට ස්ථාන මාරු ලබාදීමට හැකිවන පරිදි, ඔහුගේ කැමැත්ත නොමැතිවද, අදාල අමාත්‍යාංශ ලේකම්ගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය මත ස්ථාන මාරුවක් ලැබීමට යටත්වනු ඇත.

4.4.5 වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කිරීම, නිලධාරින්ගේ වගකීම වන අතර එසේ අයදුම් නොකරන නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරින් ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි පුරප්පාඩු ඇති වන අමාත්‍යාංශයක් /දෙපාර්තමේන්තුවක්/පළාත් සභාවක් වෙතට ස්ථාන මාරු කරනු ලැබේ.

4.4.6 ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය ස්ථාන මාරුව ක්‍රියාත්මක වන වසරේ ජනවාරි 01 දින වේ.

4.4.7 මාරුවීම් අපේක්ෂා නොකරන රජයේ ප්‍රියමනාප සේවා ස්ථානයන්හි වසර 5 ක සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරින් හා පළාතේ වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින් තමා ස්ථාන මාරු අපේක්ෂා නොකරන්නේ වුවද ස්ථාන මාරු කළහොත් යාමට අපේක්ෂිත අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව සඳහන් කර ආකෘති අංක II අනුව තොරතුරු තම සේවා ප්‍රධානියා මඟින් ඉල්ලුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් බලධාරියා වෙත නියමිත දිනට පෙර අනිවාර්යෙන්ම ඉදිරිපත් කළ යුතු වේ.

මෙම ආකෘති පත්‍රය ඉදිරිපත් නොකරන නිලධාරින් ස්ථාන මාරු කළහොත් ඕනෑම සේවා ස්ථානයකට යාමට කැමති නිලධාරින් ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

4.4.8 ඉහත 4.4.7 ඡේදයට අනුව ආකෘති අංක II න් තොරතුරු ඉදිරිපත් කළ හා ඉදිරිපත් නොකළ අමාත්‍යාංශයක/දෙපාර්තමේන්තුවක වසර 05 කට වැඩි සේවා කාලයක් සහිත නිලධාරින්ගේ/පළාත් සභාව තුල වසර 10 කට වඩා වැඩි සේවා කාලයක් සහිත නිලධාරින්ගේ සියළු තොරතුරු (ආකෘති අංක II අනුව අයදුම්පත් ඉදිරිපත් කළ හා නොකළ සියළු නිලධාරින්ගේ විස්තර ඇතුළත් කර) ආකෘති අංක III උපලේඛනය නිවැරදිව සම්පූර්ණ කර නියමිත දිනට පෙර එවීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ /පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ හා නිලධාරින් අනුයුක්ත අනෙකුත්

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන්ගේ වගකීම වේ. අනුමත නිවාඩු(වැටුප් සහිත/රහිත) ලබා සිටින නිලධාරින්ගේ විස්තර ද අනුමත වී ඇති නිවාඩු කාලය සඳහන් කරමින් උපලේඛණ අංක III ට ඇතුළත් කර ඉදිරිපත් කළ යුතුය. අනුමත වැටුප් සහිත නිවාඩු ලබා ඇති කාලසීමාව, නිවාඩුව අනුමත කරන අවස්ථාවේ සේවය කළ අදාල සේවා ස්ථානයේ සේවා කාලයක් වශයෙන් ගණනය කරනු ලැබේ. අනුමත වැටුප් රහිත නිවාඩු ලබා ඇති කාලසීමාව, නිවාඩුව අනුමත කරන අවස්ථාවේ සේවය කළ සේවා ස්ථානයේ සේවා කාලයක් වශයෙන් ගණනය කරනු නොලැබේ.

05. අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ සේවා ස්ථාන අතර වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමේදී අනුමත ස්ථාන මාරු පරිපාටියක් අනුව වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කළ යුතුය.

06. ස්ථාන මාරු ලබා පළාත් රාජ්‍ය සේවයට අනුයුක්ත වන නිලධාරින් එම පළාත තුල අනුයුක්ත කිරීම අනුමත පරිපාටියක් අනුව ස්ථාන මාරු මණ්ඩලයක නිර්දේශ මත පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ/පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් ඉටු කළ යුතුයි.

මෙම ස්ථාන මාරු පරිපාටියකට ඇතුලත් විය යුතු කරුණු පිළිබඳ මාර්ගෝපදේශ ලේකම් විසින් නිකුත් කරනු ඇත.

පළාත් රාජ්‍ය සේවාවන්ට අන්තර්ග්‍රහණය වී ඇති නිලධාරින් පළාත තුල ස්ථාන මාරුවීමක් කළයුතු යැයි පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශ ලේකම් අදහස් කරන විටකදි එසේ කිරිමට ඔහුට බලය පැවරේ. එවැනි ස්ථාන මාරුවීමකින් අතෘප්ති වන නිලධාර්න්ට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමට හැකි වේ.

07. සේවා ස්ථාන වර්ගීකරණය

ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා නිලධාරින් සේවයේ යෙදි ඇති එක් එක් පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහත පරිදි වර්ග කරනු ලැබේ.(උපලේඛන 1)

A වර්ගය - ප්‍රියමනාප
B වර්ගය - ප්‍රියමනාප නොවන
C වර්ගය - දුෂ්කර
D වර්ගය - අති දුෂ්කර

08. ස්ථාන මාරුවක් ඉල්ලීමේදි සැලකිල්ලට ගනු ලබන කරුණු:

8.1 <u>ස්ථාන මාරුවීමක් ඉල්ලීම සඳහා සපුරාලිය යුතු අවම සේවා කාලය</u>:

- අති දුෂ්කර සේවා ස්ථානයක (D) අවම වසර දෙකක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් අයදුම් කළහැකි වේ.
- දුෂ්කර සේවා ස්ථානය (C) අවම වසර තුනක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් අයදුම් කළහැකි වේ.

- ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක (B) අවම වසර හතරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් අයදුම් කළ හැකි වේ.
- ඕනෑම සේවා ස්ථානයක වසර 5 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු/පළාත තුල වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු ස්ථාන මාරුවකට අනිවාර්යයෙන්ම යටත් විය යුතුය.

8.2 <u>ස්ථාන මාරුවක් ලබාගැනීම සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමය:</u>

8.2.1 සේවය කරන ලද පළාත/දිස්ත්‍රික්කය/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අනුව නිලධාරියෙකුට ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය 70 කි.

8.2.2 ඉහත 7 ජේදයේ දැක්වෙන සේවා ස්ථාන වර්ගීකරණය අනුව ඒ ඒ සේවා ස්ථාන වල සේවය කර ඇති කාලසීමාව සැලකිල්ලට ගෙන නිලධාරින්ට පහත දැක්වෙන පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

| | | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ අනුව | දිස්ත්‍රික්ක අනුව | පළාත් අනුව |
|---|---|---|---|---|
| I. | ප්‍රියමනාප | -පූර්ණ වර්ෂයකට ලකුණු 1 | -පූර්ණ වර්ෂයකට ලකුණු 1 | -පූර්ණ වර්ෂයකට ලකුණු 1 |
| II | ප්‍රියමනාප නොවන | -පූර්ණ වර්ෂයකට ලකුණු 2 | -පූර්ණ වර්ෂයකට ලකුණු 2 | -පූර්ණ වර්ෂයකට ලකුණු 2 |
| III | දුෂ්කර | -පූර්ණ වර්ෂයකට ලකුණු 3 | -පූර්ණ වර්ෂයකට ලකුණු 3 | -පූර්ණ වර්ෂයකට ලකුණු 3 |
| IV | අති දුෂ්කර | -පූර්ණ වර්ෂයකට ලකුණු 4 | -පූර්ණ වර්ෂයකට ලකුණු 4 | -පූර්ණ වර්ෂයකට ලකුණු 4 |

වසරකට අඩු එහෙත් මාස 06 ක් හෝ ඊට වැඩි කාලයක් යම් සේවා ස්ථානයක සේවය කර ඇත්නම් ඔහුට/ඇයට අදාල සේවා ස්ථානය අයත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, දිස්ත්‍රික්කය හා පළාත අනුව අදාල සේවා ස්ථානයට හිමි ලකුණු ප්‍රමාණයෙන් 50% ක් හිමි වේ.

8.2.3 නිලධාරියා සේවය කළ කාලය සලකා ඉහත පරිදි ලකුණු ලබාදීමට අමතරව ස්ථාන මාරු ලබාදීමේදි ස්ථාන මාරු මණ්ඩලය පහත සඳහන් කරුණුද ඇගයීමකට ලක්කර ලකුණු ලබාදීමක් සිදු කෙරේ.

| | | |
|---|---|---|
| 1. | ස්ථිර පදිංචිය | 05 |
| 2. | කලත්‍රයාගේ රැකියා ස්ථානය/අභාවය | 05 |
| 3. | පාසල් යන දරුවන් සිටිම | 05 |
| 4. | මාරු මණ්ඩලයේ අභිමතය පරිදි සැලකිල්ලට ගත් විශේෂ කරුණු | 05 |
| 5. | නිලධාරින්ගේ කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීම<br>(මෙය ලිපිලේඛණ වලින් සනාථ විය යුතුය) | <u>10</u> |
| | එකතුව | 30 |

8.3 උපලේඛන අංක 1 හි සඳහන් වර්ගීකරණය අනුව අමාත්‍යාංශයකට/දෙපාර්තමේන්තුවකට/පළාතකට ස්ථාන මාරුවක් ලබා ගැනීමට සපුරාලිය යුතු මුළු සේවා කාලය පහත සඳහන් පරිදි වේ.

A - වසර 10 ක මුළු සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

B - වසර 08 ක මුළු සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

C - වසර 05 ක මුළු සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

9. ස්ථාන මාරුවීම් ඉල්ලා නොසිටින එහෙත් අමාත්‍යාංශයක/දෙපාර්තමේන්තුවක/පළාත් සභාවක අදාල සේවා කාලය සම්පූර්ණ කල නිලධාරින්ට ස්ථාන මාරු ලබාදීම සඳහා ක්‍රියා පරිපාටිය:-

9.1 ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක හෝ දුෂ්කර හෝ අති දුෂ්කර සේවා ස්ථානයක සේවය කළ නිලධාරියෙකු ස්ථාන මාරුවක් ඉල්ලූ විට එම ඉල්ලීම ඉටු කිරීමට පුරප්පාඩුවක් නැති විට, ඔහු ස්ථාන මාරුව ඉල්ලා ඇති එකී අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියාට සේවා කාලය මත උපරිම ලකුණු 100 ක් ලබා දෙන අතර, ඊට අඩු සේවා කාලයක් ඇති නිලධාරින්ට සමානුපාතිකව ලකුණු ගණනය කරනු ලැබේ.

9.2 එවැනි ලකුණු ගණනය කරන ලද නිලධාරින් සම්බන්ධව පරිපාටියේ 8.2.3 යටතේ කරුණුද ඇගයිමකට ලක් කර ලකුණු ලබා දි එම ලකුණු සේවා කාලයට ලබා දෙන ලද ඉහත ලකුණු 100 න් අඩු කරනු ලැබේ. පසුගිය වසර පහ තුල කාර්ය සාධක දර්ශක 100% ක් සපුරා ගත් බව සනාථ කෙරෙන පිළිගත හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන නිලධාරින්ට ලකුණු 10 ක් අඩු කරනු ලැබේ.

9.3 ඒ අනුව ස්ථාන මාරුවක් ඉල්ලූ නිලධාරියාගේ ඉල්ලීම ඉටුකිරීම සඳහා එකී අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ වැඩිම ලකුණු ලබාගන්නා නිලධාරියා ඉන් පිටතට ස්ථාන මාරු කළ යුතුය.

10. ආකෘති පත්‍ර I පරිදි ස්ථාන මාරු ඉල්ලුම්පත්‍රය 13 වන වගන්තියේ දැක්වෙන පරිදි එකී දිනයන්ට පෙරාතුව ඉදිරිපත් කළ යුතු වේ.

11. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම:-

11.1 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය පහත සඳහන් නිලධාරින්ගෙන් සමන්විත වේ.

01. අමාත්‍යාංශයේ නියෝජිතයෙකු
02. දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
03. පශු වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ නියෝජිතයෙකු
04. සත්ත්ව පාලන නිලධාරින්ගේ සංගමයේ නියෝජිතයෙකු

11.2 මෙම ස්ථාන මාරු මණ්ඩලය ලැබී ඇති ඉල්ලුම්පත් හා අනෙකුත් විස්තර සලකා බලා සිය යෝජනා අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. අමාත්‍යාංශ ලේකම් යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම නිකුත් කරනු ඇත.

11.3 එම දැන්වීමෙහි සඳහන් යෝජිත වාර්ෂික ස්ථාන මාරු වලින් අතෘප්තියට පත් වන නිලධාරින් විසින් සිය අභියාචනා ආකෘති පත්‍ර අංක IV අනුව සකසා ඉදිරිපත් කළ යුතුය.

වාර්ෂික ස්ථාන මාරු නියෝග වලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබනුයේ ආකෘති අංක I හෝ II මඟින් ඉල්ලීම් ඉදිරිපත් කළ නිලධාරින් පමණි.

මෙම අභියාචනය තම සේවා ප්‍රධානියා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් මඟින් අමාත්‍යාංශ ලේකම් විසින් නියෝග කරනු ලබන නිලධාරියෙකු වෙත එවිය යුතුය. නිලධාරියා කැමති නම් අභියාචනයේ ප්‍රගමන පිටපතක් එම නිලධාරියා වෙත ඉදිරිපත් කළ හැක.

11.4 වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවට අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ නිලධරයන් තිදෙනෙකු ලේකම් විසින් පත් කරනු ඇත.

11.5 සෑම වසරකම ඔක්තෝම්බර් 15 දිනට ප්‍රථම මෙම සමාලෝචන කමිටුව විසින් ඉදිරිපත්ව ඇති අභියාචනා සලකා බලා සිය නිර්දේශ අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. එම නිර්දේශ සඳහා පදනම් වූ හේතුද එම වාර්තාවෙහි අඩංගු විය යුතුය.

11.6 වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ යෝජනා ද වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ නිර්දේශ ද සැලකිල්ලට ගෙන අමාත්‍යාංශ ලේකම් විසින් වාර්ෂික ස්ථාන මාරු නියෝග නොවැම්බර් 01 දිනට පෙර නිකුත් කළ යුතුයි.

11.7 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබන සියලු නිලධාරින් නියමිත දිනට එම නියෝග පරිදි නියමිත බලධාරින් වෙත රාජකාරියට වාර්තා කළ යුතුය.

11.8 මෙම ස්ථාන මාරු නියෝග වලින් අතෘප්තියට පත් වන නිලධාරින්ට රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි 231 පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කළ හැක. එම අභියාචනා ආකෘති අංක V පරිදි ඉදිරිපත් කළ යුතු වේ.

12. වයස අවුරුදු 55 ට වැඩි නිලධාරියෙකු එකී නිලධාරියාගේ කැමැත්තක් නොමැතිව මෙම පරිපාටිය අනුව ස්ථාන මාරුවීම් වලට භාජනය නොවනු ඇත.

13. ස්ථාන මාරුවීම් සඳහා කාල සටහන:

| | | |
|---|---|---|
| (අ) | ස්ථාන මාරුවීම් ඉල්ලීම් භාරගන්නා අවසාන දිනය | : ජූලි 31 දිනට පෙර |
| (ආ) | සේවා ප්‍රධානීන් තොරතුරු සැපයිය යුතු අවසන් දිනය | : අගෝස්තු 10 දිනට පෙර |
| (ඇ) | ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම | : සැප්තැම්බර් 15 දිනට පෙර |
| (ඈ) | ස්ථාන මාරුවට එරෙහිව අභියාචනා ඉදිරිපත් කළ යුතු අවසන් දිනය | : සැප්තැම්බර් 30 දිනට පෙර |
| (ඉ) | අභියාචනා තීරණ මත අවසාන ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කිරීම | : නොවැම්බර් 01 දිනට පෙර |

14. මෙම පරිපාටියේ පිළිවෙලින් "ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පරිපාලන කටයුතු භාරව සිටින අමාත්‍යාංශයේ ලේකම්වරයාය. "අධ්‍යක්ෂ ජනරාල්" යනු සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වේ.

15. මෙම ස්ථාන මාරු ක්‍රියා පරිපාටිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1589/30 දරණ 2009.02.20 දින නිකුත් කළ අති විශේෂ ගැසට් පත්‍රයේ ඇතුළත් වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවල XVIII හා XX වැනි පරිච්ඡේදවල සඳහන් ප්‍රතිපත්ති හා විධිවිධාන වලට යටත්ව සකසා ඇත.

ලේකම්
පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධනඅමාත්‍යාංශය

ආකෘති අංක I

<u>ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත</u>

01. දැනට සේවය කරන
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව ....................................................................
පළාත ....................................................................
දිස්ත්‍රික්කය ....................................................................
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ....................................................................
පශු වෛද්‍ය කොට්ඨාශය ....................................................................

02. I. නිලධාරියාගේ සම්පූර්ණ නම ....................................................................
....................................................................................................................
II. ජාතික හැඳුනුම්පත් අංකය ....................................................................
III. දුරකථන අංකය ....................................................................

03. I. ස්ථිර පෞද්ගලික ලිපිනය: ....................................................................
....................................................................................................................
II. දැනට පදිංචි ස්ථානයේ ලිපිනය: ....................................................................
....................................................................................................................

04. I. උපන් දිනය

| අවු | මාසය | දිනය |
|---|---|---|
| | | |

II. ස්ත්‍රී/පුරුෂ භාවය: ..............................................

05. I. නිලධාරියා විවාහක/අවිවාහක ද යන බව: ......................................
II. දරුවන් ගණන, ඔවුන්ගේ නම් හා වයස්, පාසල් යන්නේ නම් ඔවුන්ගේ පාසල්:

| දරුවන්ගේ නම් | වයස | පාසල |
|---|---|---|
| | | |
| | | |

III. කලත්‍රයාගේ නම ....................................................................
කලත්‍රයාගේ සේවා ස්ථානය ....................................................................
....................................................................................................................
කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවයේ ක්‍රියාන්විත සේවයේ නියුතුද?එසේනම්
ඔහු/ඇය අයත්වන සේවාව හා තනතුර: ....................................................................
....................................................................................................................

06. I. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ දරන තනතුර: ...................................

II. දැනට සිටින පන්තිය හෝ ශ්‍රේණිය: ........................................................................

III. එම පන්තියට/ශ්‍රේණියට පත්වූ දිනය: ........................................................................

IV. මුල් පත්වීම් දිනය : ...............................................

V. පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර ඇතිද යන්න ...........................................

එසේ නම් අන්තර්ග්‍රහණය කළ ලිපියේ යොමු අංකය: ...........................................

දිනය: ...............................................

VI. වත්මන් සේවා ස්ථානයේ ලිපිනය: ........................................................................

..........................................................................................................................

07. සේවයට ඇතුලත් වූ දින සිට මේ දක්වා එක් එක් කාර්ය ස්ථානයක කර ඇති සේවා විස්තර: (මෙම ආකෘතිය සම්පූර්ණ කිරීමේදී කාර්ය ස්ථාන පිළිබඳ විස්තර ඉතා වැදගත් බැවින් මෙම ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් අනුරූප වෙනත් ඇමුණුමක් ඇතුළත් කරන්න.)

| කාර්ය ස්ථානය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වර්ගීකරණය අනුව සේවා ස්ථානයේ වර්ගය (A,B,C,D) | | | සිට - දක්වා | මුළු කාලය | රාජ්‍ය සේවයේද/පළාත් රාජ්‍ය සේවයද යනවග | සේවය කරන ලද සේවා ස්ථාන අනුව තමන් විසින් අපේක්ෂා කරනු ලබන ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|
| | | පළාත | දිස්. | ප්‍රා.ලේ.කො. | | | | |
| | | | | | | | | |

(අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සැපයීම නොකළ යුතුය.)

08. කාර්ය සාධක ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ විස්තර (සනාථ කිරීම සඳහා ලිඛිත තොරතුරු සපයා තිබීම අත්‍යාවශ්‍යයි)

..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

09. ස්ථාන මාරුව ඉල්ලා සිටින

I. පළාත් සභාව i ............................ ii ......................... iii ......................

II මධ්‍යම රජය යටතේ නම්,

අමාත්‍යාංශය: ..................................................................................

දෙපාර්තමේන්තුව: ..............................................................................

10. ස්ථාන මාරු ඉල්ලීමට හේතු:

I. .............................................................................................................................................

.............................................................................................................................................

II. ...........................................................................................................................................

.............................................................................................................................................

III. ..........................................................................................................................................

.............................................................................................................................................

11. විශේෂයෙන් සඳහන් කිරීමට හේතු ඇත්නම්

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

12. ස්ථාන මාරු පරිපාටිය අනුවහිමිවන්නේ යැයි අපේක්ෂා කරන ලකුණු ප්‍රමාණයන්

| අනු අංකය | කාරණය | ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. | සේවය කරන ලද සේවා ස්ථාන අනුව (7 ජේදය යටතේ සඳහන් කර ඇති ලකුණුවල මුළු එකතුව සටහන් කරන්න) | |
| 2. | ස්ථිර පදිංචිය | |
| 3. | කලත්‍රයාගේ රැකියා ස්ථානය/අභාවය | |
| 4. | පාසල් යන දරුවන් සිටීම | |
| 5. | මාරු මණ්ඩලයේ අභිමතය පරිදි සැලකිල්ලට ගත් කරුණු | |
| 6. | කාර්ය සාධනය (ලිඛිත තහවුරු කිරීම් සහිත) | |
| | මුළු එකතුව | |

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

දිනය: ..............................................     ................................................................

(නිලධාරියාගේ අත්සන)

II කොටස

දැනට අනුයුක්තව සේවය කරන සේවා ප්‍රධානීන්ගේ නිර්දේශ පළාත් අධ්‍යක්ෂගේ/අංශ ප්‍රධානියාගේ

නිර්දේශය

ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි. සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව නිලධාරියා මුදා හැරිය හැකිය.

දිනය: අත්සන

නිල මුද්‍රාව

---

පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරින්ට පමණක් අදාල වේ.

පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව නිලධාරියා මුදා හැරිය හැකිය.

දිනය: අත්සන

නිල මුද්‍රාව

---

පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව නිලධාරියා මුදා හැරිය හැකිය.

දිනය: අත්සන

නිල මුද්‍රාව

---

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව නිලධාරියා ...................................................................... පළාත් රාජ්‍ය සේවයේ මුදා හැරීම නිර්දේශ කර ඇත.

දිනය: අත්සන

නිල මුද්‍රාව

ආකෘති අංක II

<u>ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ වාර්ෂික ස්ථාන මාරු අයදුම් නොකරන නිලධාරින් සම්පූර්ණ කළ යුතු අයදුම් පත්‍රය</u>

01. දැනට සේවය කරන
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව ........................................................................
පළාත ..................................................................
දිස්ත්‍රික්කය ............................................................
ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය ..................................................................
පශු වෛද්‍ය කොට්ඨාශය .................................................................

02. I. නිලධාරියාගේ සම්පූර්ණ නම ..................................................................
..................................................................................................
II. ජාතික හැඳුනුම්පත් අංකය ...................................................................

03. I. ස්ථිර පෞද්ගලික ලිපිනය: ...................................................................
....................................................................................................
II. දැනට පදිංචි ස්ථානයේ ලිපිනය: ..................................................................
.....................................................................................................

04. I. උපන් දිනය

| අවු | මාසය | දිනය |
|---|---|---|
| | | |

II. ස්ත්‍රී/පුරුෂ භාවය: .............................................

05. I. නිලධාරියා විවාහක/අවිවාහක ද යන බව: ....................................
II. දරුවන් ගණන, ඔවුන්ගේ නම් හා වයස්, පාසල් යන්නේ නම් ඔවුන්ගේ පාසල්:

| දරුවන්ගේ නම් | වයස | පාසල |
|---|---|---|
| | | |
| | | |

III. කලත්‍රයාගේ නම ............................................................................
කලත්‍රයාගේ සේවා ස්ථානය .........................................................................
.............................................................................................................
කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිස් සේවයේ ක්‍රියාන්විත සේවයේ නියුතුද?එසේනම්
ඔහු/ඇය අයත්වන සේවාව හා තනතුර: ..................................................................
.............................................................................................................

06 I. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ දරන තනතුර: ...................................

II. දැනට සිටින පන්තිය හෝ ශ්‍රේණිය: .........................................................................

III. එම පන්තියට/ශ්‍රේණියට පත්වූ දිනය: .......................................................................

IV. මුල් පත්වීම් දිනය : ................................................

V. පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර ඇතිද යන්න ...........................................

එසේ නම් අන්තර්ග්‍රහණය කළ ලිපියේ යොමු අංකය: ...........................................

දිනය: ................................................

VI. වත්මන් සේවා ස්ථානයේ ලිපිනය: .......................................................................

.......................................................................................................................

07. වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කර නොමැති බැවින් ස්ථාන මාරුවක් ලබා දුන හොත් සේවය කිරීමට කැමති අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/පළාත් සභා තුනක් සඳහන් කරන්න.

I. ........................................................................................................................
II. ........................................................................................................................
III. ........................................................................................................................
IV. ........................................................................................................................
V. ........................................................................................................................

08. විශේෂයෙන් සඳහන් කිරීමට වෙනත් හේතු ඇත්නම්

..........................................................................................................................

..........................................................................................................................

09. ස්ථාන මාරු පරිපාටිය අනුව තමාට හිමි වන්නේ යැයි අපේක්ෂා කරන ලකුණු ප්‍රමාණයන් (පරිපාටියේ 9.2 අනුව)

| අනු අංකය | කාරණය | ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. | සේවය කරන ලද සේවා ස්ථාන අනුව (7 ජේදය යටතේ සඳහන් කර ඇති ලකුණුවල මුළු එකතුව සටහන් කරන්න) | |
| 2. | ස්ථිර පදිංචිය | |
| 3. | කලත්‍රයාගේ රැකියා ස්ථානය/අභාවය | |
| 4. | පාසල් යන දරුවන් සිටීම | |
| 5. | මාරු මණ්ඩලයේ අභිමතය පරිදි සැලකිල්ලට ගත් කරුණු | |
| 6. | කාර්ය සාධනය (ලිඛිත තහවුරු කිරීම් සහිත) | |
| මුළු එකතුව | | |

ආසන්න වසර 05 ක කාර්ය සාධන වාර්තා පිටපත් අමුණා ඇත.

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

දිනය: .............................................. ..............................................................

(නිලධාරියාගේ අත්සන)

## II කොටස

## දැනට අනුයුක්තව සේවය කරන සේවා ප්‍රධානීන්ගේ නිර්දේශ පළාත් අධ්‍යක්ෂගේ/අංශ ප්‍රධානියාගේ නිර්දේශය

ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බව සහතික කරමි. සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව නිලධාරියා මුදා හැරිය හැකිය.

දිනය: අත්සන

නිල මුද්‍රාව

---

පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරින්ට පමණක් අදාල වේ.

පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව නිලධාරියා මුදා හැරිය හැකිය.

දිනය: අත්සන

නිල මුද්‍රාව

---

පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව නිලධාරියා මුදා හැරිය හැකිය.

දිනය: අත්සන

නිල මුද්‍රාව

---

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව නිලධාරියා ...................................................................... පළාත් රාජ්‍ය සේවයේ මුදා හැරීම නිර්දේශ කර ඇත.

දිනය: අත්සන

නිල මුද්‍රාව

ආකෘති අංක III

එක් අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක අවුරුදු පහකට වැඩි /එක් පළාත් සභාවක අවුරුදු 10 කට වැඩි කාලයක් සේවය කර ඇති උපලේඛණගත තනතුරු නොදරන සියළුම නිලධාරින්ගේ විස්තර මෙහි අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතු බව සලකන්න.

වැඩිම සේවා කාලය ඇති නිලධාරින්ගේ නම මුලින්ම ඇතුළත් විය යුතු බව සලකන්න. (සේවා කාලය ගණනය කළ යුත්තේ වසරේ ජූනි 30 දිනටයි.)

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව
...................................................................................................................

දිස්ත්‍රික්කය ..........................................................

| නිලධාරියාගේ නම (මයා/මිය/මෙය) යන්න සඳහන් කරන්න | ජාතික හැ.ප. අංකය | තනතුර/ශ්‍රේණිය | උපන් දිනය හා ................ දිනට වයස | වර්තමාන සේවා ස්ථානය හා එහි සේවා කාලය ජූනි 30 දිනට | විවාහක/අවිවාහක බව | කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් සංඛ්‍යාව හා පාසල් යන දරුන් සංඛ්‍යාව | දැනට පදිංචි ප්‍රදේශය හා ලිපිනය | මුල් පත්වීමේ දින සිට සේවය කළ ස්ථාන හා කාල සීමාවන් | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්කර තිබේද? අයදුම්කර නොමැති නම් ස්ථාන මාරුවක් ලැබුණහොත් සේවය කිරීමට කැමති අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/පළාත් 3 ක් අනුපිළිවෙලින් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

සකස් කළේ: නම .....................................................  අත්සන: ........................................................

මෙම අමාත්‍යාංශයේ,දෙපාර්තමේන්තුවේ අවුරුදු පහකට වැඩි/එක් පළාත් සභාවක අවුරුදු 10 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සියළුම නිලධාරින් පිළිබඳ විස්තර මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බවත්, සියළුම තොරතුරු නිවැරදි බවත් මෙයින් සහතික කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සම්බන්ධයෙන් අදාළ විනය නිලධාරියාට වාර්තා කිරීමට සිදු විය හැකි බව සැලකිල්ලට ගනිමින් සහතික කරමි.

සකස් කළේ: නම ................................................................ අත්සන ..........................................................

දිනය: අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව)

ආකෘති අංක IV

(තමා අනුයුක්ත සේවා  ස්ථානයේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුයි)

නම ..................................................................

තනතුර ..................................................................

ලිපිනය ..................................................................

දිනය ..................................................................

............................................................ මඟින්,

පශු සම්පත් විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම්.

<u>යෝජිත වාර්ෂික ස්ථාන මාරුව සම්බන්ධයෙන් කරුණු දැක්වීම</u>

ඔබගේ අංක ...................................................... හා ............................ දිනැති ලිපිය/යෝජිත වාර්ෂික ස්ථාන මාරු ලේඛනය මඟින් මා ..................................................................................... ට ස්ථාන මාරු කිරිට යෝජිත බව දන්වා ඇත./අයදුම්පත ප්‍රතික්ෂේප වී ඇති බව දන්වාඇත./මා විසින් ඉදිරිපත් කළ ........................... දිනැති ස්ථාන මාරු අයදුම්පත අනුව මාරු ස්ථාන  ලබා දී නොමැත.

02. පහතින් විස්තර කරනු ලබන කරුණු මත එම යෝජිත ස්ථානමාරුව අවලංගු කරන ලෙස, සංශෝධනය කරන ලෙස, නැවත සලකා බලන ලෙස/ස්ථාන මාරුවක් ලබා දෙන ලෙස/ප්‍රතික්ෂේපිත අයදුම්පත නැවත සලකා බලන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති 1 කාණ්ඩයෙහි 209 වන වගන්තිය ප්‍රකාරව ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

2.1 ....................................................................................................................................

....................................................................................................................................

2.2 ....................................................................................................................................

....................................................................................................................................

2.3 ....................................................................................................................................

....................................................................................................................................

03. ඉහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා අදාළ පහත සඳහන් ලියවිලි වල සහතික කළ ඡායා පිටපත් මේ සමඟ යා කර ඇත.

04. මාගේ වාර්ෂික ස්ථාන මාරුව පහත සඳහන් සේවා ස්ථානයකට ලබා දෙන ලෙසද ඉල්ලමි.

පළමුවන මනාපය ..............................................................................

දෙවන මනාපය ..............................................................................

තුන්වන මනාපය ..............................................................................

.................................................

අත්සන

1. ලේකම්, පශු සම්පත් විෂය භාර රේඛීය අමාත්‍යාංශය
2. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
3. ............................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

අමාත්‍යාංශ ලේකම්,

............................................................................................ විසින් ඉහතින් දක්වා ඇති කරුණු සත්‍ය බවට සෑහීමකට පත්වෙමි/නොවෙමි. ඉල්ලීම ඉටු කිරීම නිර්දේශ කරමි/නොකරමි.

දිනය ................................................

අත්සන ............................................................

නම ................................................................

තනතුර ............................................................

නිල මුද්‍රාව

ආකෘති අංක V

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ වාර්ෂික ස්ථාන මාරු කිරීම් සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අභියාචනය

01. නිලධාරියා පිළිබඳ විස්තර

1.1 සම්පූර්ණ නම : ....................................................................................................................

1.2 අයත් වන ශ්‍රේණිය ....................................................................................................................

පන්තිය ................................ ශ්‍රේණිය ..........................

1.3 තනතුර: ..............................................................

1.4 සේවා ස්ථානය: ....................................................................................................................

1.5 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය:

....................................................................................................................................

1.6 අදාල අමාත්‍යංශය ....................................................................................................................

02. අභියාචනයට පදනම්ව ඇති තීරණය/නියෝගය පිළිබඳ විස්තර

2..1 තීරණය/නියෝගය කුමක්ද? යන වග සැකෙවින්

....................................................................................................................................

....................................................................................................................................

....................................................................................................................................

2.2 තීරණය/නියෝගය දෙන ලද්දේ කා විසින්ද?

....................................................................................................................................

....................................................................................................................................

2.3 තීරණය/නියෝගය නිලධරයාට ලැබුණු දිනය: ................................................

2.4 තීරණය/නියෝගය දැක්වෙන ලිපිවල සහතික කළපිටපත් පහතින් දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම 1 ....................................................................................................................

ඇමුණුම 2 ....................................................................................................................

2.5 අදාල වෙනත්කරුණු

....................................................................................................................................

....................................................................................................................................

03. තීරණය/නියෝගයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමටහේතු

3.1 ....................................................................................................................

....................................................................................................................

3.2 ....................................................................................................................

....................................................................................................................

3.3 ........................................................................................................................................
........................................................................................................................................
3.4 ........................................................................................................................................
........................................................................................................................................
3.5 ........................................................................................................................................
........................................................................................................................................
3.6 මෙම හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපත් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යාකර ඇත.

ඇමුණුම 1 ..........................................................................................................................

ඇමුණුම 2 ..........................................................................................................................

ඇමුණුම 3 ..........................................................................................................................

.

04. ඉල්ලා සිටිනු ලබන සහන:

........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................
........................................................................................................................................

දිනය: ....................................................

අත්සන: ....................................................

නම: ....................................................

තනතුර: ....................................................

පිටපත්

1. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - අවශ්‍ය කටයුතු සඳහා මෙම ප්‍රගමන පිටපත් ඔබ වෙත කාරුණිකව යොමුකරමි.

## සේවා ස්ථාන වර්ගීකරණය

| පළාත | පළාත් වර්ගීකරණය | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් වර්ගීකරණය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වර්ගීකරණය |
|---|---|---|---|---|---|
| බස්නාහිර | A | කොළඹ | A | කොළම | A |
| | | | | දෙහිවල-ගල්කිස්ස | A |
| | | | | හෝමාගම | A |
| | | | | හංවැල්ල | A |
| | | | | කැස්බෑව | A |
| | | | | පිළියන්දල | B |
| | | | | කොළොන්නාව | C |
| | | | | කඩුවෙල | B |
| | | | | මොරටුව | A |
| | | | | මහරගම | A |
| | | | | පාදුක්ක | C |
| | | | | ශ්‍රී ජයවර්ධනපුර කොට්ටේ | A |
| | | | | තිඹිරිගස්යාය | A |
| | | ගම්පහ | A | අත්තනගල්ල | A |
| | | | | බියගම | A |
| | | | | දොම්පෙ | A |
| | | | | දිවුලපිටිය | A |
| | | | | ගම්පහ | A |
| | | | | ජාඇල | A |
| | | | | කැළණිය | A |
| | | | | කටාන | C |
| | | | | මීනුවන්ගොඩ | A |
| | | | | මීරිගම | A |
| | | | | මහර | A |
| | | | | මීගමුව | A |
| | | | | වත්තල | A |
| | | කළුතර | A | අගලවත්ත | B |
| | | | | බේරුවල | B |
| | | | | බුලත්සිංහල | C |
| | | | | බණ්ඩාරගම | B |
| | | | | දොඩන්ගොඩ | B |
| | | | | හොරණ | A |
| | | | | ඉංගිරිය | C |
| | | | | කළුතර | A |
| | | | | මතුගම | A |
| | | | | මිල්ලනිය | C |
| | | | | මදුරාවල | C |
| | | | | පානදුර | A |
| | | | | පාලින්ද නුවර | C |
| | | | | වලල්ලාවිට | C |

| | | | | | |
|---|---|---|---|---|---|
| මධ්‍යම | A | මහනුවර | A | අකුරණ | A |
| | | | | දොළුව | B |
| | | | | දෙල්තොට | B |
| | | | | ගඟ ඉහළ කෝරළේ | B |
| | | | | හතරලියද්ද | B |
| | | | | හාරිස්පත්තුව | A |
| | | | | කුණ්ඩසාලේ | A |
| | | | | ගඟවට කොරළේ | A |
| | | | | මිණිපේ | C |
| | | | | මැදදුම්බර/තෙල්දෙණිය | B |
| | | | | පස්බාගේ කොරලේ | B |
| | | | | පාතදුම්බර | A |
| | | | | පාතහේවාහැට | A |
| | | | | පූජාපිටිය | B |
| | | | | පන්විල | C |
| | | | | තුම්පනේ | B |
| | | | | උඩපළාත | A |
| | | | | උඩුනුවර | A |
| | | | | උඩුදුම්බර | C |
| | | | | යටිනුවර | A |
| | | මාතලේ | A | අඹන්ගඟ කොරළේ | B |
| | | | | දඹුල්ල | B |
| | | | | ගලේවෙල | B |
| | | | | ලග්ගල-පල්ලේගම | C |
| | | | | මාතලේ | A |
| | | | | නාඋල | B |
| | | | | පල්ලේපොල | B |
| | | | | රත්තොට | B |
| | | | | උකුවෙල | B |
| | | | | විල්ගමුව | D |
| | | | | යටවත්ත | B |
| | | නුවරඑළිය | C | අඹගමුව | A |
| | | | | හඟුරන්කෙත | B |
| | | | | කොත්මලේ | C |
| | | | | නුවරඑළිය | A |
| | | | | වලපනේ | C |
| දකුණ | B | ගාල්ල | A | අම්බලන්ගොඩ | A |
| | | | | අක්මීමන | A |
| | | | | බලපිටිය | B |
| | | | | බෙන්තොට | A |
| | | | | බෝපෙ-පෝද්දල | B |
| | | | | බද්දේගම | A |
| | | | | ඇල්පිටිය | A |
| | | | | ගාල්ල කඩවත්සතර | A |
| | | | | හික්කඩුව | A |
| | | | | හබරාදූව | A |
| | | | | ඉමදූව | B |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | කරන්දෙණිය | A |
| | | | | නෙළුව | C |
| | | | | නියාගම | B |
| | | | | නාගොඩ | C |
| | | | | තවලම | C |
| | | | | වැලිපිටිය-දිවිතුර | B |
| | | | | යක්කලමුල්ල | B |
| | | හම්බන්තාට | C | අඟුණකොලපැලැස්ස | C |
| | | | | අම්බලන්තොට | C |
| | | | | බෙලිඅත්ත | C |
| | | | | හම්බන්තොට | C |
| | | | | කටුවන | C |
| | | | | ලුණුගම්වෙහෙර | C |
| | | | | ඕකේවෙල | C |
| | | | | සූර්යවැව | C |
| | | | | තිස්සමහාරාමය | C |
| | | | | තංගල්ල | B |
| | | | | වීරකැටිය | C |
| | | මාතර | A | අතුරලිය | C |
| | | | | අකුරැස්ස | B |
| | | | | දික්වැල්ල | B |
| | | | | දෙවිනුවර | B |
| | | | | හක්මන | B |
| | | | | කිරින්ද පුහුල්වැල්ල | C |
| | | | | කොටපොල | C |
| | | | | කඹුරුපිටිය | B |
| | | | | මාතර කඩවත්සතර | A |
| | | | | මුලටියන | C |
| | | | | මාලිම්බඩ | C |
| | | | | පිටබැද්දර | C |
| | | | | පස්ගොඩ | C |
| | | | | තිහගොඩ | C |
| | | | | වැලිපිටිය | C |
| | | | | වැලිගම | A |
| උතුර | D | යාපනය | B | ඩෙල්ෆ්ට් | D |
| | | | | කයිට්ස් | D |
| | | | | වෙලනායි | C |
| | | | | යාපනය | A |
| | | | | නල්ලූර් | B |
| | | | | චාවාකච්චේරි | A |
| | | | | වඩමාරච්චි-නැගෙනහිර | D |
| | | | | පේදුරුතුඩුව | A |
| | | | | කෝපායි | B |
| | | | | විලක්කාමම්-උතුර | C |
| | | | | උඩුවිල් | A |
| | | | | සන්දිලිපායි | B |
| | | | | විලක්කාමම්-බටහිර | C |
| | | | | වඩමාරච්චි දකුණ-බටහිර | D |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | කිලිනොච්චිය | D | කරච්චි | D |
| | | | | කන්දවලායි | D |
| | | | | පූනක්රේ | D |
| | | | | පච්චිලයි පල්ලි | D |
| | | මන්නාරම | D | මන්නාරම නගරය | D |
| | | | | මන්තායි බටහිර | D |
| | | | | මුසලායි | D |
| | | | | මධු | D |
| | | | | නානාටන් | D |
| | | මුලතිව් | D | මැරිටයිම් පත්තු | D |
| | | | | මන්තායි නැගෙනහිර | D |
| | | | | ඔඩ්ඩුසුඩාන් | D |
| | | | | පුතුකුඩිරුප්පු | D |
| | | | | තුනල්ටර්නි | D |
| | | වවුනියාව | C | වවුනියාව උතුර | D |
| | | | | වවුනියාව දකුණ | B |
| | | | | වෙන්ගල වෙඩ්ඩිකුලම් | C |
| | | | | වවුනියාව | A |
| නැගෙනහිර | D | අම්පාර | C | අක්කරේපත්තු | A |
| | | | | අලයාඩිවෙම්බු | B |
| | | | | අම්පාර | A |
| | | | | අමාලච්චේනෙයි | B |
| | | | | දෙහිඅත්තකණ්ඩිය | B |
| | | | | දමන | C |
| | | | | එරගම | C |
| | | | | කරෙයිතිවු | A |
| | | | | කල්මුනේ | A |
| | | | | ලාහුගල | D |
| | | | | මහඔය | C |
| | | | | නින්දාවූර් | A |
| | | | | නාවිදන්වේලි | A |
| | | | | පොතුවිල් | B |
| | | | | පදියතලාව | D |
| | | | | සමන්තුරේ | A |
| | | | | සායින්දමරදු | B |
| | | | | තිරුක්කෝවිල් | A |
| | | | | උහන | B |
| | | මඩකලපුව | C | එරාවූර් නගරය | B |
| | | | | එරාවූර් පත්තු | A |
| | | | | වාලච්චේනෙයි | B |
| | | | | කෝරලේ පත්තු උතුර | A |
| | | | | කෝරලේ පත්තු බටහිර | B |
| | | | | කාතාන්කුඩි | A |
| | | | | මන්මුනේ පත්තු | A |
| | | | | මන්මුනේ දකුණ සහ එරුවිල් පත්තු | C |
| | | | | මන්මුනේ දකුණ බටහිර | C |
| | | | | මන්මුනේ බටහිර | C |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | මන්මුනේ උතුර | A |
| | | | | පොරාතිවු පත්තු (1) | C |
| | | ත්‍රිකුණාමලය | B | ගෝමරන්කඩවල | D |
| | | | | කින්නියා | A |
| | | | | කුච්චවේලි | B |
| | | | | කන්තලේ | A |
| | | | | මුත්තූර් | B |
| | | | | මොරවැව | B |
| | | | | පදවි ශ්‍රී පුර | C |
| | | | | සේරුවිල | C |
| | | | | ත්‍රිකුණාමල නගරය | A |
| | | | | තඹලගමුව | A |
| | | | | ඊච්චිලම් පත්තු | D |
| වයඹ | B | කුරුණෑගල | A | අඹන්පොල | B |
| | | | | අලව්ව | A |
| | | | | බිංගිරිය | B |
| | | | | බමුණාකොටුව | C |
| | | | | ඇහැටුවැව | C |
| | | | | ගනේවත්ත | B |
| | | | | ගිරිබාව | D |
| | | | | ගල්ගමුව | C |
| | | | | ඉබ්බාගමුව | A |
| | | | | කොබෙයිගනේ | B |
| | | | | කොටවෙහෙර | C |
| | | | | කුලියාපිටිය නැගෙනහිර | A |
| | | | | කුලියාපිටිය බටහිර | A |
| | | | | කුරුණෑගල | A |
| | | | | කොටුපොත | B |
| | | | | මල්ලවපිටිය | C |
| | | | | මාස්පොත | C |
| | | | | මාවතගම | A |
| | | | | මාහෝ | B |
| | | | | නිකවැරටිය | B |
| | | | | නාරම්මල | A |
| | | | | පන්නල | A |
| | | | | පොල්ගහවෙල | A |
| | | | | පොල්පිතිගම | D |
| | | | | පඩුවස්නුවර | B |
| | | | | රිදීගම | B |
| | | | | රස්නායකපුර | D |
| | | | | උඩුබද්දාව | B |
| | | | | වීරම්බුගෙදර | C |
| | | | | වාරියපොළ | A |
| | | පුත්තලම | B | ආරච්චිකට්ටුව | A |
| | | | | ආනමඩුව | C |
| | | | | හලාවත | A |
| | | | | දංකොටුව | A |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | කරුවලගස්වැව | D |
| | | | | කල්පිටිය | D |
| | | | | මහකුඹුක්කඩවල | D |
| | | | | මහවැව | B |
| | | | | මුන්දෙල් | B |
| | | | | මාදම්පෙ | B |
| | | | | නවගත්තේගම | D |
| | | | | නාත්තන්ඩිය | A |
| | | | | පුත්තලම | B |
| | | | | පල්ලම | C |
| | | | | වනාතවිල්ලුව | D |
| | | | | වෙන්නප්පුව | A |
| උතුරුමැද | C | අනුරාධපුරය | B | ගල්නෑව | B |
| | | | | ගලෙන්බිදුණුවැව | B |
| | | | | හොරොව්පතාන | D |
| | | | | ඉපලෝගම | B |
| | | | | කැබිතිගොල්ලෑව | D |
| | | | | කැකිරාව | A |
| | | | | කහටගස්දිගිලිය | B |
| | | | | මැදවච්චිය | B |
| | | | | මිහින්තලේ | B |
| | | | | මහවිලච්චිය | D |
| | | | | නැගෙනහිර නුවරගම් පළාත | A |
| | | | | නාච්චාදූව | B |
| | | | | නොච්චියාගම | B |
| | | | | මධ්‍යම නුවරගම් පළාත | A |
| | | | | පලාගල | C |
| | | | | පලුගස්වැව | C |
| | | | | පදවිය | C |
| | | | | රඹෑව | C |
| | | | | රාජාංගනය | B |
| | | | | තඹුත්තේගම | A |
| | | | | තිරප්පනේ | B |
| | | | | තලාව | B |
| | | පොළොන්නරුව | B | දිඹුලාගල | C |
| | | | | ඇලහැර | B |
| | | | | හිඟුරක්ගොඩ | A |
| | | | | ලංකාපුර | B |
| | | | | මැදිරිගිරිය | B |
| | | | | තමන්කඩුව | A |
| | | | | වැලිකන්ද | D |
| සබරගමුව | B | කෑගල්ල | A | අරනායක | C |
| | | | | බුලත්කොහුපිටිය | C |
| | | | | දැරණියගල | D |
| | | | | දෙහිඕවිට | B |
| | | | | ගලිගමුව | B |
| | | | | කෑගල්ල | A |
| | | | | මාවනැල්ල | A |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | රුවන්වැල්ල | B |
| | | | | රඹුක්කන | B |
| | | | | වරකාපොල | A |
| | | | | යටියන්තොට | C |
| | | රත්නපුර | B | අයගම | D |
| | | | | බලංගොඩ | D |
| | | | | ඇලපාත | C |
| | | | | ඇඹිලිපිටිය | B |
| | | | | ඇහැලියගොඩ | A |
| | | | | ගොඩකවෙල | B |
| | | | | ඉඹුල්පෙ | B |
| | | | | කලවාන | C |
| | | | | කිරිඇල්ල | B |
| | | | | කොලොන්න | C |
| | | | | කුරුවිට | B |
| | | | | කහවත්ත | C |
| | | | | නිවිතිගල | C |
| | | | | ඕපනායක | C |
| | | | | පැල්මඩුල්ල | B |
| | | | | රත්නපුර | A |
| | | | | වැලිගෙපොල | D |
| ඌව | C | බදුල්ල | B | බණ්ඩාරවෙල | A |
| | | | | බදුල්ල | A |
| | | | | ඇල්ල | C |
| | | | | හපුතලේ | B |
| | | | | හල්දුම්මුල්ල | D |
| | | | | හාලි ඇල | D |
| | | | | කන්දකැටිය | D |
| | | | | ලුණුගල | D |
| | | | | මීගහකිවුල | D |
| | | | | මහියංගනය | C |
| | | | | පස්සර | B |
| | | | | රිදිමාලියද්ද | D |
| | | | | සොරණාතොට | C |
| | | | | පරණගම | C |
| | | | | වැලිමඩ | B |
| | | මොණරාගල | C | බිබිල | C |
| | | | | බුත්තල | C |
| | | | | බඩල්කුඹුර | C |
| | | | | කතරගම | D |
| | | | | මැදගම | D |
| | | | | මොණරාගල | B |
| | | | | මඩුල්ල | D |
| | | | | සියඹලාන්ඩුව | D |
| | | | | සෙවනගල | D |
| | | | | තණමල්විල | D |
| | | | | වැල්ලවාය | C |

රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල සේවා ස්ථානය පිහිටි පළාත, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඉහත වගුව අනුව සලකා බැලිය යුතුයි.